www.agaram.lk



සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

22046

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2015 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2015 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2015

සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය I
தொடர்பாடலும் ஊடகக் கற்கையும் I
Communication and Media Studies I

29 S I

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
Two hours

**උපදෙස්:**

- **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ **විභාග අංකය** ලියන්න.
- උත්තර පත්‍රයේ දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.
- **1** සිට **50** තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන හෝ** පිළිතුර තෝරාගෙන, එය **උත්තර පත්‍රයේ පසුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක්** (X) **යොදා දක්වන්න.**

**1.** විකේතිකරණය යනු පණිවිඩය,
(1) සම්ප්‍රේෂණය කරන්නා ය.
(2) අර්ථකථනය කරන්නා ය.
(3) පෝෂණය කරන්නා ය.
(4) ප්‍රතිග්‍රහණය කරන්නා ය.
(5) ප්‍රතික්ෂේප කරන්නා ය.

**2.** ඩේවිඩ් කේ. බර්ලෝ ඉදිරිපත් කළ නාලිය පිළිබඳ අදහස් නිරූපණයට අදාළ **නොවන්නේ,**
(1) ශ්‍රවණයයි. (2) ආඝ්‍රාණයයි. (3) දැකීමයි. (4) රසදැනීමයි. (5) නියෝජනයයි.

**3.** හැරල්ඩ් ඩී. ලැස්වෙල් ආකෘතිය,
(1) රේඛීය සන්නිවේදන ලක්ෂණ පෙන්නුම් කරන්නකි.
(2) ප්‍රතිපෝෂණය පිළිබඳ අවධානය යොමු කරන්නකි.
(3) අර්ථකථනයේ ලක්ෂණ පෙන්නුම් කරන්නකි.
(4) සන්නිවේදන බාධක හඳුන්වා දෙන්නකි.
(5) චක්‍ර සන්නිවේදන ලක්ෂණ පෙන්නුම් කරන්නකි.

**4.** උදෑසන අවදිවන රවීට හිසරදයක් දැනුණි. ඒ අනුව ඔහු සිය කාර්යාලයට නොයෑමට තීරණය කළේ ය. මෙබඳු අවස්ථාවක දක්නට ලැබෙන්නේ,
(1) අවිධිමත් සන්නිවේදනයයි.
(2) අන්තර්වර්ති පුද්ගල සන්නිවේදනයයි.
(3) අන්තර් පුද්ගල සන්නිවේදනයයි.
(4) නිර්වාචික සන්නිවේදනයයි.
(5) විධිමත් සන්නිවේදනයයි.

**5.** සමාජ විද්‍යාඥයින්ගේ මතය අනුව ජනශ්‍රැති තුළින් සමාජ, ආර්ථික, සංස්කෘතික ලක්ෂණ අධ්‍යයනය කළ හැකි ය. මෙය වඩාත් සමීප වන්නේ,
(1) ඉතිහාස අධ්‍යයනයට ය.
(2) මානවවිද්‍යාත්මක අධ්‍යයනයට ය.
(3) මනෝවිද්‍යාත්මක අධ්‍යයනයට ය.
(4) පුරාවිද්‍යාත්මක අධ්‍යයනයට ය.
(5) නිර්මාණාත්මක අධ්‍යයනයට ය.

**6.** සන්නිවේදනයේ ස්වභාවය හඳුන්වාදීමේ දී වඩාත් ගැළපෙන අදහස වන්නේ,
(1) සන්නිවේදනය භාෂාව මත පදනම් වීමයි.
(2) සන්නිවේදනය ද්විමාර්ගික වීමයි.
(3) සන්නිවේදනය ක්‍රියාවලියක් වීමයි.
(4) සන්නිවේදනය බාධක සහිත වීමයි.
(5) සන්නිවේදනය ප්‍රතිචාර මත පැවතීමයි.

**7.** "මහජන සම්බන්ධතා යනු කිසියම් සංවිධානයක් සහ එයට අදාළ ජනතාව අතර අන්‍යෝන්‍ය අවබෝධය ස්ථාපිත කර පවත්වා ගෙනයෑම සඳහා සිතාමතා, සැලසුම් සහගතව, ඉවසීමෙන් යුතුව දරනු ලබන ප්‍රයත්නයකි." මෙම නිර්වචනය ඉදිරිපත් කරන ලද්දේ,
(1) බ්‍රිතාන්‍ය මහජන සම්බන්ධතා ආයතනයෙනි.
(2) එඩ්වර්ඩ් එල්. බර්නීස් විද්‍යාඥයා විසිනි.
(3) ඇමරිකානු මහජන සම්බන්ධතා ආයතනයෙනි.
(4) ඉන්දියානු මහජන සම්බන්ධතා ආයතනයෙනි.
(5) අයිවි ලී විද්‍යාඥයා විසිනි.

[ දෙවැනි පිටුව බලන්න.

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

www.agaram.lk



8. "තොරතුරු අයිතිය යනු ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක පවත්නා මූලික අදහසකි." එවැන්නකට බාධාකාරී පරිසරයක් නිර්මාණය වනු ඇතැයි අවබෝධ කරගත හැක්කේ කවර සන්නිවේදන සංකල්පය අනුව ද?
(1) අධිපතිවාදී සංකල්පය
(2) නිදහස් මතවාදී සංකල්පය
(3) සමාජ වගකීම් සංකල්පය
(4) සමාජ ප්‍රජාතන්ත්‍රවාදී සංකල්පය
(5) සංවර්ධනාත්මක සංකල්පය

9. සිංහල ටෙලි නාට්‍ය පමණක් නරඹා තිබූ කමල්ට ප්‍රථමවරට නැරඹූ කොරියානු ටෙලිනාට්‍ය අන්තර්ගතය හරිහැටි වටහා ගැනීම දුෂ්කර විය. සන්නිවේදන දෘෂ්ටිකෝණයට අනුව මෙය,
(1) සංස්කෘතික ප්‍රකම්පනයකි.
(2) ප්‍රතිපෝෂණ දුබලතාවකි.
(3) රසවින්දනය පිළිබඳ ගැටලුවකි.
(4) සහානුභූතිය පිළිබඳ ගැටලුවකි.
(5) අත්දැකීම් ක්ෂේත්‍රය සම්බන්ධ ගැටලුවකි.

10. නවෝත්පාදන විසරණය යනුවෙන් හැඳින්වෙන්නේ,
(1) විල්බර් ශ්‍රාම් ඉදිරිපත් කළ අදහසකි.
(2) දේශපාලන මත පැතිරවීම පිළිබඳ අදහසකි.
(3) නව සොයාගැනීම් හා තාක්ෂණය ප්‍රජාවට හඳුන්වා දීමකි.
(4) නූතන සන්නිවේදන සංකල්පයක මූලික ලක්ෂණයකි.
(5) නූතන සංවර්ධනය හා බැඳුණු නිර්වචනයකි.

11. අතීතයේ දී මහජන සම්බන්ධතා නිලධාරියාගේ කාර්යභාරය බොහෝ විට ඉටු කරන ලද්දේ,
(1) කාන්තාවන් විසිනි.
(2) ආගමික පූජකවරුන් විසිනි.
(3) තරුණ පිරිස් විසිනි.
(4) රජ පවුලේ සාමාජිකයින් විසිනි.
(5) වෘත්තිකයින් විසිනි.

12. කණ්ඩායමක නායකයකුගේ 'විසම්මුතියේ අගය' ප්‍රකට වන්නේ,
(1) තමන් ඉදිරිපත් කරන මතය අන් අය වෙත හොඳින් ඒත්තු ගැන්වීමෙනි.
(2) තනි අදහසක් කරා සමූහය මෙහෙයවීමෙනි.
(3) විවිධත්වයෙන් යුත් අදහස් යටපත් කිරීමට කටයුතු කිරීමෙනි.
(4) සියලු දෙනාගේ ම අදහස්වලට අනුව කටයුතු කිරීමෙනි.
(5) විවිධ අදහස් මතුවීමට ඉඩ දී සාධනීය අදහස් සාකච්ඡාවට ලක් කිරීමෙනි.

13. භාෂා උපාර්ජනය යනුවෙන් හඳුන්වන්නේ,
(1) වචනවලට නව අර්ථ ජනනය හා තහවුරු කිරීමයි.
(2) ව්‍යාකරණ රීති මනාව හඳුනා ගැනීම හා භාවිතයට ගැනීමයි.
(3) භාෂාවේ ප්‍රධාන ස්වරූප හා ධාරා ගැන අවබෝධයයි.
(4) භාෂාව ග්‍රහණය කර ගැනීම හා පරිහරණය ඉගෙනීමයි.
(5) භාෂාවේ පොදු හා අනන්‍ය ලක්ෂණ හඳුනා ගැනීමයි.

14. පුද්ගලයකුට පණිවිඩයක් නිසියාකාරව අවබෝධ කර ගැනීමට හා අර්ථකථනය කර ගැනීමට හැකියාව ඇති වන්නේ,
(1) විචාරය තුළිනි.
(2) සාක්ෂරතාව තුළිනි.
(3) විශ්ලේෂණය තුළිනි.
(4) සහවේදනය තුළිනි.
(5) ඇගයීම තුළිනි.

15. නිර්මාණාත්මක සංදේශයක දැකගත හැකි වැදගත් ම ලක්ෂණය වන්නේ,
(1) කල්පිත බවයි.
(2) ශ්‍රව්‍ය දෘශ්‍ය බවයි.
(3) විචිත්‍ර බවයි.
(4) අපූර්වත්වයයි.
(5) ප්‍රාසංගික බවයි.

16. යහළුවන් කිහිප දෙනකු අතර ඇති වූ සංවාදයක දී ප්‍රකාශ වූ අදහස් කිහිපයක් පහත දැක්වේ.
- රවි - මම ඔබේ ගැටලුව තේරුම් ගත්තා - නිසැකව ම මම එන්නම්.
- විමල් - මට ඔබේ ගැටලුව හොඳින් දැනෙනවා - අනිවාර්යයෙන් මම එන්නම්.
- කමල් - මට ඔබේ ගැටලුව පැහැදිලියි - අනිවාර්යයෙන් මම එන්නම්.
- සුරේෂ් - මට ඔබේ ගැටලුව පේනවා - නිසැකව ම මම එන්නම්.

මින් 'සහවේදන' සංකල්පයට වඩාත් සමීප අදහස දක්වන්නේ,
(1) රවි විසිනි.
(2) විමල් විසිනි.
(3) කමල් විසිනි.
(4) සුරේෂ් විසිනි.
(5) විමල් හා කමල් විසිනි.

17. පෝස්ටර් මාධ්‍යය පිළිබඳ සාකච්ඡාවක දී මතු වූ අදහස් කිහිපයක් පහත දැක්වේ.
A - ආකර්ෂණීය ව සංදේශයක් ඉදිරිපත් කළ හැකි ය.
B - වැදගත් තොරතුරු කෙටියෙන් දැක්විය හැකි ය.
C - විශාල පිරිසකට එක ම අවස්ථාවක තොරතුරු ඇතුළු දිය හැකි ය.
D - සෑම විට ම සන්නිවේදකයා පැහැදිලි ව හඳුනාගත හැකි ය.
E - කාලගුණික සාධක මත සංදේශයට බාධා මතුවිය හැකි ය.

මින් පෝස්ටර් මාධ්‍ය හා වඩාත් ගැළපෙන කරුණු වන්නේ,
(1) A, B හා C ය. (2) A, B හා D ය. (3) A, B හා E ය. (4) B, C හා D ය. (5) C, D හා E ය.

[ තුන්වැනි පිටුව බලන්න.

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

www.agaram.lk



**18.** ප්‍රධාන පෙළේ බිස්කට් සමාගමක සේවකයන්ගේ වාර්ෂික විනෝද චාරිකාවකට යොදාගත් බස්රථ සියල්ල ම ආයතනයේ සන්නාමය (Brand Name) සහිත වර්ණ ස්ටිකර්වලින් සරසා තිබුණි. මෙවැන්නකින් මූලික ව අපේක්ෂා කරන්නේ,
(1) ආයතනයේ කීර්තිනාමය ප්‍රචලිත කිරීමටයි.
(2) අභ්‍යන්තරික මහජන සම්බන්ධතා උපක්‍රමයක් භාවිතයට ගැනීමටයි.
(3) සේවක සුබසාධනය පිළිබඳ දක්වන උනන්දුව පෙන්නුම් කිරීමටයි.
(4) නිර්මාණාත්මක ව ප්‍රචාරණයක් ලබා ගැනීමටයි.
(5) සේවකයින්ට තමන් පැමිණි බස්රථ හඳුනා ගැනීමටයි.

**19.** ජනමාධ්‍ය මගින් සංවර්ධනය සඳහා විශාල පෙලඹවීමක් ඇති කළ හැකි බව ප්‍රකාශ කරන ලද සන්නිවේදන විද්‍යාඥයා වන්නේ,
(1) විල්බර් ශ්‍රාම් ය.
(2) ලූෂන් පායි ය.
(3) එවරට් එම්. රොජර්ස් ය.
(4) පාවුලෝ ෆියරේ ය.
(5) කර්ට් ලෙවින් ය.

**20.** අද්‍යතන මානව සංස්කෘතික තත්ත්වයේ විශේෂතාව වන්නේ,
(1) ජාතිකකරණයයි.
(2) වාර්ගිකකරණයයි.
(3) ගෝලීයකරණයයි.
(4) සාමූහිකකරණයයි.
(5) ආධ්‍යාත්මිකකරණයයි.

**21.** ආකේතන ක්‍රියාවලියේ දී සන්නිවේදකයා වඩාත් අවධානයට යොමු කළ යුත්තේ,
(1) ආකර්ෂණීය සංකේත භාවිත කිරීමට ය.
(2) නිර්මාණාත්මක සංකේත භාවිත කිරීමට ය.
(3) සන්නිවේදක කේන්ද්‍රීය සංකේත භාවිත කිරීමට ය.
(4) සම්මත සංකේත භාවිත කිරීමට ය.
(5) දෘශ්‍ය රූප බහුල සංකේත භාවිත කිරීමට ය.

**22.** සන්නිවේදනය පණිවිඩ ප්‍රතිනිර්මාණය වීමේ ක්‍රියාවක් ලෙස අර්ථ නිරූපණය කළේ,
(1) පෝල් ලැසාර්ස්ෆෙල්ඩ් ය.
(2) විල්බර් ශ්‍රාම් ය.
(3) ෂැනොන් හා වීවර් ය.
(4) ඩේවිඩ් කේ. බර්ලෝ ය.
(5) හැරල්ඩ් ඩී. ලැස්වෙල් ය.

**23.** ආධ්‍යාත්මික සන්නිවේදනයට අයත් **නොවන්නේ**,
(1) ආගමික සන්නිවේදනයයි.
(2) කලාත්මක සන්නිවේදනයයි.
(3) දේශපාලන සන්නිවේදනයයි.
(4) සාහිත්‍ය සන්නිවේදනයයි.
(5) පුරාණෝක්තික සන්නිවේදනයයි.

**24.** පහත සඳහන් ප්‍රකාශවලින් පැහැදිලි වන භාෂා ප්‍රභේද අනුපිළිවෙළ තෝරන්න.
A - එකම කාරණය විවිධාකාරයෙන් ඉදිරිපත් කිරීම
B - භාෂා උච්චාරණ සමඟ ඉරියව් හැසිරීම් රටා දක්නට ලැබීම
C - රිද්ම, වේගය, යෙදුම් ආදියේ සුවිශේෂතා පැවතීම
(1) A - විවරණය B - කථනය C - භාෂණය
(2) A - භාෂණය B - විවරණය C - රූපණය
(3) A - රූපණය B - කථනය C - විවරණය
(4) A - විවරණය B - රූපණය C - කථනය
(5) A - කථනය B - විවරණය C - භාෂණය

**25.** සමාජ අලෙවිකරණ දැන්වීම,
(1) සමාජ ජාල සන්නිවේදනයෙන් මතුවූවකි.
(2) ඉලක්ක කණ්ඩායම් තුළ සේවා අලෙවිකරණ ක්‍රියාවලියට අයත් වූවකි.
(3) සමාජ ප්‍රජාතන්ත්‍රීයකරණ සන්නිවේදන කාර්යයකි.
(4) ජනප්‍රිය සංස්කෘතික භාවිතයෙන් ප්‍රවර්ධනය වූවකි.
(5) සංවර්ධනාත්මක සන්නිවේදන භාවිතයකි.

**26.** මිනිසා තොරතුරු හා සන්නිවේදන මාධ්‍ය සමඟ ගත කරන කාලය ක්‍රමික ව ඉහළ යමින් පවතින බව පර්යේෂණ වාර්තා මගින් තහවුරු වී තිබේ. එවැනි පසුබිමක් නිර්මාණය වී ඇත්තේ,
(1) ලොව්පුරා රූපවාහිනී මාධ්‍යයේ ව්‍යාප්තිය හේතුවෙනි.
(2) ප්‍රවෘත්ති ඒජන්සිවල ක්‍රියාකාරිත්වය හේතුවෙනි.
(3) අන්තර්ජාල සබඳතා සුලබ වීම හේතුවෙනි.
(4) ජංගම දුරකථනවල ශීඝ්‍ර ව්‍යාප්තිය හේතුවෙනි.
(5) නව සන්නිවේදන තාක්ෂණ උපකරණ සරල වීම හේතුවෙනි.

[ හතරවැනි පිටුව බලන්න.

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

www.agaram.lk



22046

Agaram.LK - Keep your dreams alive!

**27.** ගෝලීය සංස්කෘතියේ හැඩගැසීම ආරම්භ වන්නේ,
(1) 20 වන සියවස අවසානයේ දී ය.
(2) රෝම යුගය අවසානයේ දී ය.
(3) නූතන යුගය ආරම්භයේ දී ය.
(4) මධ්‍යතන යුගය අවසානයේ දී ය.
(5) පුරාතන යුගය අවසානයේ දී ය.

**28.** පුවත්පතක දෘශ්‍ය ආකර්ෂණය ප්‍රවර්ධනය සඳහා යොදා ගත හැකි උපක්‍රම අතරට **නොවැටෙන්නේ,**
(1) රේඛා හා හැඩතල භාවිතයයි.
(2) චිත්‍ර හා කාටූන් යොදා ගැනීමයි.
(3) ඡායාරූප හා වර්ණ භාවිතයයි.
(4) කෙටි වාක්‍ය හා සජීවී බසක් යොදා ගැනීමයි.
(5) විවිධ අකුරු විලාස හා ප්‍රමාණ භාවිතයයි.

**29.** සමාජ සහජීවනය සඳහා වඩාත් අනුබල දෙන සංස්කෘතික ප්‍රවණතාව වන්නේ,
(1) සංස්කෘතික විසරණය ය.
(2) සංස්කෘතික සංසරණය ය.
(3) සංස්කෘතික ඒකකෘතිකරණය ය.
(4) සංස්කෘතික කම්පනය ය.
(5) සංස්කෘතික හුවමාරුව ය.

**30.** පුද්ගලාන්තර සන්නිවේදනයට අදාළ ලක්ෂණයක් **නොවන්නේ,**
(1) සන්නිවේදනය කළ දේ වෙනස් කළ නොහැකි බවයි.
(2) සංඥා සංකේත භාවිත කළ හැකි බවයි.
(3) අර්ථ ගොඩනැංවීම සිදු කළ හැකි බවයි.
(4) සම්බන්ධතා ඇති කර පවත්වාගෙන යා හැකි බවයි.
(5) අපට සන්නිවේදනයෙන් වැළකී සිටිය නොහැකි බවයි.

**31.** පහත සඳහන් ශ්‍රවණ අවස්ථා හතරට අනුරූප තත්ත්ව තෝරන්න.
A - සංගීතයට සවන් දීම හෝ විනෝදාත්මක කථාවක් ශ්‍රවණය කිරීම
B - ගැටලුවකට පත් මිතුරෙකුට සවන් දීම
C - විශේෂ දේශනයකට සවන් දීම
D - මැතිවරණ කථාවකට සවන් දීම
(1) අගය කිරීම, විමර්ශනාත්මක, විචාරාත්මක, සහවේදනය
(2) අගය කිරීම, විචාරාත්මක, විමර්ශනාත්මක, සහවේදනය
(3) අගය කිරීම, සහවේදනය, විමර්ශනාත්මක, විචාරාත්මක
(4) අගය කිරීම, විමර්ශනාත්මක, සහවේදනය, විචාරාත්මක
(5) අගය කිරීම, විචාරාත්මක, සහවේදනය, විමර්ශනාත්මක

**32.** විකල්ප මාධ්‍ය පිළිබඳ ව පන්ති කාමරයේ සාකච්ඡාවක් මතු විය.
කමනී - විකල්ප මාධ්‍ය වුණාට ඒවායින් ලාභ ලබන්නත් පුළුවන්.
රමණී - ඒ වුණාට ලාභ ලැබීම ප්‍රධාන පරමාර්ථයක් නොවෙයි.
ගයනී - විශාල කාර්ය මණ්ඩලයක් නොමැති වීම නිසා වියදමත් අඩුයි.
ජයනී - ඒ වගේ ම ග්‍රාහක පිරිසත් සීමාසහිතයි.
ඉහත ප්‍රකාශ අතුරෙන් විකල්ප මාධ්‍ය හා ගැළපෙන ප්‍රකාශ ඉදිරිපත් කර ඇත්තේ,
(1) කමනී, රමණී හා ගයනී ය.
(2) කමනී, ගයනී හා ජයනී ය.
(3) රමණී, ගයනී හා ජයනී ය.
(4) කමනී, රමණී හා ජයනී ය.
(5) කමනී, රමණී, ගයනී හා ජයනී යන සියල්ල ම ය.

**33.** ඩෙංගු වසංගතය පිළිබඳ කියුබාහු වාර්තා චිත්‍රපටයක් ශ්‍රී ලංකාවේ රෝගය ව්‍යාප්ත වෙමින් පැවැති ප්‍රදේශවල ප්‍රදර්ශනය කෙරිණි. එය සංවර්ධන සංදේශයක් ලෙස වැදගත් වන්නේ,
(1) සමාන අත්දැකීමක් පිළිබඳ තොරතුරු ඉදිරිපත් වන බැවිනි.
(2) විදේශ රටක අත්දැකීමක් වන බැවිනි.
(3) එක හා සමාන සංස්කෘතික ස්වභාවයක් සහිත බැවිනි.
(4) රටේ සෑම පුරවැසියකුට ම සංදේශය ගමන් කරන බැවිනි.
(5) ප්‍රතිකාර ක්‍රම හා බෙහෙත් වර්ග පිළිබඳ අවබෝධයක් ලැබෙන බැවිනි.

**34.** ජනමාධ්‍ය මගින් ජනමතය සකස් කිරීම සිදු කරනු ලබන්නේ,
A - තොරතුරු ප්‍රවාහයට මැදිහත් වීමෙනි.
B - තොරතුරු ප්‍රවාහය තෝරා ගැනීමෙනි.
C - හැසිරීමෙනි.
ඉහත ප්‍රකාශ අතුරෙන් නිවැරදි වන්නේ,
(1) A ය.
(2) B ය.
(3) C ය.
(4) B හා C ය.
(5) A, B හා C යන සියල්ල ම ය.

[ පස්වැනි පිටුව බලන්න.

agaram.lk

www.agaram.lk



Agaram.LK - Keep your dreams alive!

Agaram.LK - Keep your dreams alive!

**35.** ග්‍රාහක පිරිස හඳුනා ගැනීම පිළිබඳ පන්ති කාමරයේ දී මතු වූ නිරීක්ෂණ කිහිපයක් පහත දැක්වේ.

A - ග්‍රාහක පිරිසේ සංයුතිය අඛණ්ඩ ව වෙනස් වෙමින් පවතී.
B - අනන්‍යතාව පිළිබඳ අවබෝධයක් නොමැත.
C - එකිනෙකා අතර අන්තර් සබඳතා අතිශය සීමිත ය.

ඉහත ප්‍රකාශ අනුව එබඳු ග්‍රාහක පිරිසක් හඳුන්වනු ලබන්නේ,

(1) කණ්ඩායම් ග්‍රාහක පිරිසක් ලෙසිනි. (2) පුද්ගලාන්තර ග්‍රාහක පිරිසක් ලෙසිනි.
(3) ජන ග්‍රාහක පිරිසක් ලෙසිනි. (4) ප්‍රාදේශීය ග්‍රාහක පිරිසක් ලෙසිනි.
(5) ඉලක්ක ග්‍රාහක පිරිසක් ලෙසිනි.

- අංක **36** සිට **40** තෙක් ප්‍රශ්නවලට පහත දැක්වෙන විවිධ සන්නිවේදන අංග ඇසුරෙන් පිළිතුරු සපයන්න.

| | | |
|---|---|---|
| A - ආකේතිකරය/සන්නිවේදකයා | B - පණිවිඩය | C - බලපෑම |
| D - සංඥා | E - විකේතිකරය/ග්‍රාහකයා | F - බාධක |
| G - අර්ථකථනය | H - නාලිය | I - සම්ප්‍රේෂක/ට්‍රාන්ස්මිටරය |
| J - අග්‍රස්ථානය | K - මූලාශ්‍රය | L - ප්‍රතිපෝෂණය |
| M - අත්දැකීම් ක්ෂේත්‍රය | N - සන්දර්භය | |

**36.** ඉහත සඳහන් අංග අතුරෙන් හැරල්ඩ් ඩී. ලැස්වෙල් නිර්වචනයට අයත් **නොවන** අංග තුනක් වන්නේ,
(1) A, C හා I ය. (2) C, G හා K ය. (3) D, G හා H ය. (4) D, K හා L ය. (5) M, B හා N ය.

**37.** ෂැනොන් හා වීවර් ආකෘතියට අයත් අංග අනුපිළිවෙළ වන්නේ,
(1) A, B, D, H, N ය. (2) A, I, D, E, J ය. (3) K, I, D, E, J ය.
(4) K, I, D, M, J ය. (5) K, I, G, L, J ය.

**38.** ඉහත දක්වා ඇති අංග අතුරෙන් A හා E අතර අවබෝධයක් ගොඩනැඟීමට D **අපොහොසත්** වන්නේ නම්, එය හඳුන්වන්නේ,
(1) C ලෙස ය. (2) F ලෙස ය. (3) G ලෙස ය. (4) L ලෙස ය. (5) M ලෙස ය.

**39.** ඉහත සඳහන් අංග අතුරෙන් ශ්‍රාම්-ඔස්ගුඩ් ආකෘතියේ ලක්ෂණ හඳුනා ගත හැකි වරණය කුමක් දැයි තෝරන්න.
(1) A, B, E, G ය. (2) A, B, E, J ය. (3) A, E, C, M ය.
(4) B, D, N, G ය. (5) B, E, H, G ය.

**40.** ඉහත දක්වන ලද අංග අතුරෙන් සන්නිවේදන ක්‍රියාවලිය අඛණ්ඩ ව පවත්වාගෙන යාම සඳහා සන්නිවේදකයාට මෙන් ම ග්‍රාහකයාට ද වැදගත් වන්නේ,
(1) C හි හැකියාවයි. (2) G හි හැකියාවයි. (3) J හි හැකියාවයි. (4) K හි හැකියාවයි. (5) N හි හැකියාවයි.

**41.** පුවත්පතක සංස්කාරකවරයකුට ලැබුණු ලිපියක අක්ෂර වින්‍යාස හා ව්‍යාකරණ දෝෂ සහිත වාක්‍ය කිහිපයක් දක්නට ලැබුණි. එහි සඳහන් ව තිබූ නිවැරදි වාක්‍යය කුමක් ද?
(1) ළමයා තම ප්‍රතිපල පිළිබඳ අසතුටුවිය. (2) අසළ පන්තිකාමරයෙහි කිසිවකු නොසිටියහ.
(3) සාම මණ්ඩලයට සියළු සාමාජිකයන් පැමිනෙයි. (4) අප අවංක වුවහොත් කවුරුත් අපට ප්‍රශංසා කරති.
(5) තාත්තාද නංගීද මම ද පාසැලට ගියෙමි.

**42.** දැව භාණ්ඩ නිෂ්පාදනයේ යෙදී සිටින ප්‍රමුඛ පෙළේ ව්‍යාපාරික සමාගමක් මහජන සම්බන්ධතා ව්‍යාපෘතියක් ලෙස ලෝක පරිසර දිනය වෙනුවෙන් රුක් රෝපණයේ වැදගත්කම සහිත නිර්මාණාත්මක දැන්වීම් මාලාවක් පළකර තිබුණි. මෙය,
(1) තම දැව භාණ්ඩවල නිෂ්පාදන මට්ටම උසස් බව සනාථ කිරීමට ගත් උත්සාහයකි.
(2) පරිසර දිනය සැමරීම සඳහා අනුග්‍රාහකත්වය දැක්වීමකි.
(3) සමාගමේ කීර්තිනාමය ඉහළ නැංවීමට ගත් පියවරකි.
(4) තම නිෂ්පාදනවලට අවශ්‍ය අමුද්‍රව්‍ය සපයා ගැනීමට ගත් දිගුකාලීන ක්‍රියාවලියකි.
(5) රුක් රෝපණයේ ඇති වැදගත්කම පිළිබඳ මහජන මතයක් නිර්මාණය කරන්නකි.

**43.** සංවර්ධන සන්නිවේදකයකුගේ ගුණාංග පිළිබඳ සාකච්ඡාවක් පාසල් මාධ්‍ය සමාජයේ දී මතු විය.
සුරේෂ් - සංදේශය ඉදිරිපත් කිරීමට වඩාත් උචිත මාධ්‍යය තෝරාගැනීම ඉතා වැදගත් ය.
මධු - වඩා ප්‍රමුඛතාව හිමිවන්නේ ගැටලු හඳුනා ගැනීමටයි.
කමල් - පවත්නා තත්ත්වයන්ට අනුගත වීමත් වැදගත් ය.

ඉහත ප්‍රකාශ අතුරෙන්,
(1) සුරේෂ් පමණක් නිවැරදි වේ. (2) සුරේෂ් හා මධු පමණක් නිවැරදි වේ.
(3) සුරේෂ් හා කමල් පමණක් නිවැරදි වේ. (4) මධු හා කමල් පමණක් නිවැරදි වේ.
(5) සුරේෂ්, මධු හා කමල් තිදෙනා ම නිවැරදි වේ.

[ හයවැනි පිටුව බලන්න.

agaram.lk

www.agaram.lk



**44.** පහත දැක්වෙන ප්‍රකාශ අතුරෙන් ජනමාධ්‍ය ක්‍රියාකාරිත්වය පිළිබඳ ලක්ෂණ හා **නොගැළපෙන** ප්‍රකාශය තෝරන්න.
(1) ග්‍රාහකයින්ගේ සක්‍රීය සහභාගිත්වයක් දක්නට ලැබේ.
(2) සැමවිට ම ඉහළ සිට පහළට තොරතුරු ගමන් කරයි.
(3) ප්‍රවෘත්ති තුළ මැතිවරණ දේශපාලනය පදනම් කරගත් තොරතුරුවලට ප්‍රමුඛතාව හිමි වේ.
(4) ගෝලීය තොරතුරු ගම්මානයක් බිහිවීම ජනමාධ්‍යයේ අතුරු ඵලයකි.
(5) විවිධ මාධ්‍ය ආයතනවල තනි අයිතිය මාධ්‍ය ඒකාධිකාරියක් නිර්මාණය කරයි.

**45.** සුනාමි අවස්ථාවක දී ඒ ඒ ස්ථානවල සිටින පුද්ගලයින්ට දැනුම් දීමට භාවිත කළ හැකි වඩාත් යෝග්‍ය නාලිකාව කුමක් දැයි තෝරන්න.
A - වෙරළබඩ පාසල් ක්‍රීඩා පිටියක පාපන්දු ක්‍රීඩා කරමින් සිටින සිසු පිරිසක්
B - ගොඩබිමට ඉතා ආසන්න ව මුහුදේ රැඳී සිටින ධීවර පිරිසක්
C - රටේ විවිධ ස්ථානවල සිටින පොදු ජනතාව
D - මෙම සුනාමි අවස්ථාව හා ඊට පෙර අවස්ථා සංසන්දනය කරමින් සිටින ජනමාධ්‍යකරුවන් පිරිසක්
ඉහත කණ්ඩායම්වලට ගැළපෙන නාලිකා අනුපිළිවෙළ වන්නේ,
(1) ගුවන්විදුලිය හා රූපවාහිනිය, අන්තර්ජාලය, සයිරන්, ජංගම දුරකථනය
(2) ජංගම දුරකථනය, සයිරන්, ගුවන්විදුලිය හා රූපවාහිනිය, අන්තර්ජාලය
(3) සයිරන්, ජංගම දුරකථනය, ගුවන්විදුලිය හා රූපවාහිනිය, අන්තර්ජාලය
(4) සයිරන්, ගුවන්විදුලිය හා රූපවාහිනිය, ජංගම දුරකථනය, අන්තර්ජාලය
(5) ගුවන්විදුලිය හා රූපවාහිනිය, ජංගම දුරකථනය, අන්තර්ජාලය, සයිරන්

**46.** මහජන සම්බන්ධතා පිළිබඳ **නොගැළපෙන** ප්‍රකාශය තෝරන්න.
(1) මහජනතාව අත්‍යවශ්‍ය පාර්ශ්වකරුවෙකි.
(2) සැම විට ම මුදල් ගෙවා සිදු කරන්නකි.
(3) සබඳතා ගොඩනැංවීම ප්‍රමුඛතම කාර්යයකි.
(4) විවිධ පාර්ශ්වවලට වාසි ගෙන දෙයි.
(5) සුබවාදී දැනුම්වත් කිරීම මූලික අරමුණකි.

**47.** එක්තරා රටක අගමැතිවරයකු මැතිවරණයට ආසන්නයේ දී තම කුඩා දරුවා පාසලෙන් රැගෙන යාමට එක් දිනයක දී පැමිණීම එරට බොහෝ ජනමාධ්‍ය ප්‍රධාන ප්‍රවෘත්තියක් ලෙස වාර්තා කර තිබුණි. මෙවැන්නක් විග්‍රහ කළ හැකිවන්නේ,
(1) දෙමාපියන් හා දරුවන් අතර ඇති සබඳතාවෙහි ස්වභාවයක් ලෙසිනි.
(2) පුද්ගල ප්‍රතිරූපය ඉහළ නැංවීමට ගත් උත්සාහයක් ලෙසිනි.
(3) ජනමාධ්‍ය ප්‍රසිද්ධ පුද්ගලයින්ගේ පෞද්ගලික කටයුතුවලට මැදිහත් වීමක් ලෙසිනි.
(4) ඕපාදූපවලට ජනමාධ්‍ය තුළ ඉහළ ඉල්ලුමක් පවත්නා බව සනාථ කරන්නක් ලෙසිනි.
(5) කවර තනතුරක් දැරුව ද සැම පුද්ගලයකු ම සමාන බව පෙන්වීමට ගත් උත්සාහයක් ලෙසිනි.

**48.** ගැටුම්, සමාජයෙහි ප්‍රගමනයට හේතු වන අවස්ථාවක් ලෙස යොදා ගත හැක්කේ,
(1) නිරාකරණය තුළිනි.
(2) මැඩ පැවැත්වීම තුළිනි.
(3) කළමනාකරණය තුළිනි.
(4) සමථකරණය තුළිනි.
(5) විපරිවර්තනය තුළිනි.

**49.** ග්‍රාහකයා පිළිබඳ වඩාත් නිදොස් ප්‍රකාශය වන්නේ,
(1) දෙදෙනකු නොමැති තැන ග්‍රාහකයකු නොසිටීමයි.
(2) ග්‍රාහක භූමිකාව ස්ථිර ව පැවතීමයි.
(3) ග්‍රාහකයාට සැමවිට ම අර්ථකථනය කිරීමෙහි කුසලතා පැවැතීමයි.
(4) ග්‍රාහක සාක්ෂරතාව සම මට්ටමේ නොපැවැතීමයි.
(5) ග්‍රාහකයාගේ චින්තන ක්ෂේත්‍රය පුළුල් ව පැවැතීමයි.

**50.** විද්‍යුත් මාධ්‍ය ආයතන පිහිටුවීමෙහිලා තියුණු තරගකාරිත්වයක් උද්ගත වී ඇත්තේ,
(1) දේශපාලන පවුල් බල සම්බන්ධතාව නිසා ය.
(2) සීමිත සම්පතක් වන සංඛ්‍යාත පද්ධතිය මත පදනම් වන නිසා ය.
(3) වාණිජ ව්‍යාපාර ආයතනවල සෘජු දායකත්වයක් පවතින නිසා ය.
(4) සමාජයේ ජනමත නිර්මාණයට පුළුල් ලෙස මැදිහත් වන නිසා ය.
(5) ජනසන්නිවේදන ක්‍රියාවලියට පහසුකම් සපයන්නෙක් වන නිසා ය.

* * *

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

www.agaram.lk

22047

AL/2015/29/S-II

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2015 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2015 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2015

සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය II
தொடர்பாடலும் ஊடகக் கற்கையும் II
Communication & Media Studies II

29 S II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

**උපදෙස්:**

※ ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න. එක් ප්‍රශ්නයකට හිමි ලකුණු සංඛ්‍යාව **20**කි.

**1.** (i) අන්තර්වර්තී පුද්ගල සන්නිවේදනය සතු ප්‍රධාන ලක්ෂණ **හතරක්** නම් කරන්න.

(ii) මාධ්‍ය සංස්කෘතියේ ලක්ෂණ **හතරක්** නම් කර, ඉන් **එකක්** පිළිබඳ කෙටියෙන් විස්තර කරන්න.

(iii) චිත්‍රපට හා රූපවාහිනී මාධ්‍ය සතු ලක්ෂණ **තුනක්** සංසන්දනාත්මක ව විස්තර කරන්න.

(iv) වර්තමාන ජනමාධ්‍ය ක්‍රියාවලිය තුළ වාරණය ක්‍රියාත්මක වන විධි **හතරක්** උදාහරණ ඇසුරෙන් පැහැදිලි කරන්න.

**2.** පාසල් මාධ්‍ය සමාජයක් සාර්ථක ව පවත්වාගෙන යාමට අභ්‍යන්තර මෙන් ම බාහිර කමිටු පිහිටුවා ගැනීම අවශ්‍ය වේ.

(i) පාසල් මාධ්‍ය සමාජයේ බාහිර කමිටුවට සම්බන්ධ කරගත හැකි පුද්ගලයන් **හතරදෙනකු** නම් කරන්න.

(ii) ඔබගේ පාසලට වැදගත් වන සංවර්ධන ව්‍යාපෘතියක් නම් කොට, එබඳු සංවර්ධන ව්‍යාපෘති, ඇගයුම් ක්‍රියාවලියට අයත් කරුණු **තුනක්** දක්වා, ඉන් **එකක්** පිළිබඳ ව කෙටියෙන් පහදන්න.

(iii) පුවත්පතක පළ වූ මානසික ගැටලුවක් පිළිබඳ විශේෂාංග ලිපියක් ගැන පාසල් පන්තිකාමරයේ දී සාකච්ඡා විය. පුද්ගල මානසිකත්වය බිඳ වැටීම නිසා ඇති වන අයහපත් පුද්ගල චර්යා **හතරක්** නම් කර, ඉන් **දෙකක්** උදාහරණ සහිත ව පහදන්න.

(iv) ජනමාධ්‍ය සම්මුඛ සාකච්ඡාවල වැදගත්කම කරුණු **දෙකක්** පදනම් කර ගෙන, උදාහරණ **දෙක** බැගින් සපයමින් විස්තර කරන්න.

**3.** පුවත්පතක ප්‍රධාන සංස්කාරක තනතුර සඳහා ඔබ තෝරාගෙන ඇතැයි උපකල්පනය කරන්න.

(i) පුවත්පතෙහි සිරස්තල යොදා ගැනීමේ දී සැලකිල්ලට ගත යුතු කරුණු **හතරක්** නම් කරන්න.

(ii) මාධ්‍ය සාක්ෂරතාවෙහි අවශ්‍යතාව පිළිබඳ කරුණු **හතරක්** දක්වා, ඉන් **එකක්** පිළිබඳ කෙටි විස්තරයක් ලියන්න.

(iii) විකල්ප ජනමාධ්‍යයෙහි ලක්ෂණ **හතරක්** නම් කර, ඉන් **දෙකක්** ගැන පැහැදිලි කරන්න.

(iv) මාධ්‍ය විචාරයේ ඇති අවශ්‍යතාව පිළිබඳ කරුණු **හතරක්** පදනම් කර ගනිමින්, සංස්කාරක වැකියක් (editorial) ලියන්න.

**4.** ආහාර නිෂ්පාදන ආයතනයක මහජන සම්බන්ධතා නිලධාරියා ඔබ යැයි සිතන්න. ආයතනයේ ආහාර සම්බන්ධයෙන් මතු වූ ගැටලුවක් පැහැදිලි කිරීමට මාධ්‍ය සාකච්ඡාවක් කැඳවීමට ඔබට පැවරී තිබේ.

(i) මාධ්‍ය සාකච්ඡාවක් සංවිධානය කිරීමේ දී අවධානය යොමු කළ යුතු කරුණු **හතරක්** නම් කරන්න.

(ii) මහජන සම්බන්ධතාව සඳහා නව මාධ්‍ය භාවිත කළ හැකි විධික්‍රම **දෙකක්** කෙටියෙන් පැහැදිලි කරන්න.

(iii) රූපවාහිනියේ ප්‍රචාරය වන ආහාර දැන්වීම් මගින් පාරිභෝගිකයාට සිදුවන බලපෑම කරුණු **තුනක්** ඇසුරෙන් පැහැදිලි කරන්න.

(iv) ජනශ්‍රැති අංග **හතරක්** නම් කොට, ඉන් **තුනක්** ආයතනයේ ප්‍රචාරණ කටයුතු සඳහා යොදා ගත හැකි ආකාරය පිළිබඳ ව පැහැදිලි කරන්න.

**5.** (i) ජනප්‍රිය සංස්කෘතියේ මූලික ලක්ෂණ **හතරක්** නම් කරන්න.

(ii) ප්‍රචණ්ඩත්වය පුවත්පත් මාධ්‍ය තුළ නිරූපණය වන ආකාර **දෙකක්** කෙටියෙන් පහදන්න.

(iii) නව මාධ්‍ය භාෂා භාවිතයේ විශේෂතා **තුනක්** කෙටියෙන් විස්තර කරන්න.

(iv) සංස්කෘතික හුවමාරුවේ වැදගත්කම කරුණු **හතරක්** ඇසුරෙන් පහදන්න.

[දෙවැනි පිටුව බලන්න.

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

www.agaram.lk



6. ඔබ උදැසන දුටු රිය අනතුරක් පිළිබඳ ප්‍රවෘත්තියක් එදින ම රාත්‍රියේ රූපවාහිනී ප්‍රවෘත්ති තුළින් දැකගත හැකි විය. එහෙත් ඔබ දුටු සිදුවීම හා විකාශය වූ ප්‍රවෘත්තිය අතර වෙනස්කම් පැවතුණි.

(i) ජනමාධ්‍ය වාර්තාකරණය තුළ එබඳු වෙනස්කම් ඇතිවීම හඳුන්වන ප්‍රධාන සංකල්පය කුමක් ද?

(ii) රිය අනතුරු අවම කිරීමේ උපදේශාත්මක සන්දේශ සහිත විශාල ප්‍රචාරණ පුවරු (Billboards) රට පුරා සවි කිරීමට යෝජනා වී ඇත. එවැනි විශාල ප්‍රචාරණ පුවරුවල වැදගත්කම කරුණු **දෙකක්** ඇසුරෙන් පහදන්න.

(iii) රිය අනතුර පුවත්පත්වලින් ද වාර්තා කර තිබුණි. පුවත්පත සෙසු ජන මාධ්‍යවලින් වෙනස් වන ආකාර **හතරක්** දක්වා, ඉන් **දෙකක්** පැහැදිලි කරන්න.

(iv) ඔබ ඇසින් දුටු අනතුර තවත් පුද්ගලයකුට විස්තර කිරීමේ දී භාවිත කෙරෙන සන්නිවේදන වර්ගයේ විශේෂ ලක්ෂණ **හතරක්** සවිස්තරාත්මක ව පැහැදිලි කරන්න.

7. සන්නිවේදනය සාමූහික ක්‍රියාවලියකි.

(i) සන්නිවේදන මූලිකාංග **හතරක්** නම් කරන්න.

(ii) පුද්ගලයා දේහ භාෂාව භාවිත කරමින් සිදුකරන නිර්වාචික සන්නිවේදන ක්‍රම **හතරක්** නම් කර, ඉන් **එකක්** පිළිබඳ කෙටි විස්තරයක් කරන්න.

(iii) පුරවැසි මාධ්‍යකරුවා, ජනමාධ්‍යවේදියාගෙන් වෙනස් වන ආකාර **තුනක්** විස්තර කරන්න.

(iv) දෙපියවර සංකල්පය රූපසටහනක් මඟින් පෙන්වා දී, එහි මූලික පියවර **දෙක** පිළිබඳ විස්තර කරන්න.

* * *

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk
agaram.lk